# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 ජූලි මස 26 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.08.01 දින නිකුත් කරන ලදී)


# සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන)

**2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය* : මේ වගන්තිය මගින් 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සේවකයන්ගේ මාසික සහ දෛනික අවම වේතනය වැඩි කිරීම වේ.

## සේවකයන්ගේ ජාතික අවම වේතනය
## (සංශෝධන)

එල්.ඩී.-ඕ. 29/2024

### 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

1. මේ පනත 2024 අංක        දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2016 අංක 3 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම*

2. 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් දොලොස් දහස් පන්සියයක් විය යුතු අතර, සේවකයකුගේ ජාතික අවම දෛනික වේතනය රුපියල් පන්සියයක් විය යුතු ය." යන වචන වෙනුවට "රුපියල් දාහත් දහස් පන්සියයක් විය යුතු අතර, සේවකයකුගේ ජාතික අවම දෛනික වේතනය රුපියල් හත්සියයක් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.